ස්ථාවර නියෝග අංක 119(4) අනුව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද වාර්තාවේ සඳහන් නිරීක්ෂණ හා ගෙන ඇති ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 290

ආයතනයේ නම : පරිසර අමාත්‍යාංශය

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ආයතනය ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	ඇතැම් අවස්ථාවලදී විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමේදී වෙනත් රාජ්‍ය ආයතනවලින් ද තොරතුරු ලබාගෙන විවිධ අංශ මඟින් සකස් කරන පිළිතුරු ඒකාබද්ධ කර අවසන් වාර්තාව සකස් කිරීමට සිදුවේ. එබැවින් විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීමට ප්‍රමාද වූ අවස්ථා පැවැති නමුත් මෙවැනි ප්‍රමාදයන් ඉදිරියේදී සිදු නොවීමට කටයුතු කරමින් පවතී.
සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	අමාත්‍යාංශයේ නාමයන් වෙනස්වීම මත එම මෝටර් රථ අයත් ආයතනය සොයා ගැනීමට අපහසු වී ඇත. මේ බව දන්වා කොමිස්ට්‍රෝලර් ජනරාල් වෙත කිහිප අවස්ථාවක දී උපදෙස් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත .
සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	වාහනවල රාජ්‍ය ලාංඡනය ඇලවීමට කටයුතු කරන අතර මේ වන විට පිරිවිතර සකස් කරමින් පවතී.
වාහනයක් ගර්හිත වී මාස 8 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	වාහන අපහරණය කිරීම සඳහා තක්සේරු මණ්ඩලයක් පත් කර ඇති අතර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් මෝටර් වාහන පරීක්ෂකයෙකු නම් කල වහාම වාහන අපහරණය කිරීමට කටයුතු කරනු ඇත.
නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කර ඇත.	වර්තමානයේදී නියමිත කාලය තුළ ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	• 2021 වර්ෂයේ සංවර්ධන නිලධාරී තනතුරු සංඛ්‍යාව එම වර්ෂය වන විට පරිසර අමාත්‍යාංශය සඳහා අනුමත තනතුරු සංඛ්‍යාවට අතිරික්තව තනතුරු

	02 ක් පැවති අතර 2020.12.15 දිනැති අංක 02/02/ADM/විවිධ-10 දරන ලිපිය මගින් සේවා අවශ්‍යතාවය මත පරිසර අමාත්‍යාංශය සඳහා දැනට අනුමත සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාවට වඩා සංවර්ධන නිලධාරීන් 30 දෙනෙකු අනුමත කර දෙන මෙන් මු.රෙ 71 යටතේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇත. • තවද දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් සඳහාම පරිසර නිලධාරියෙකු පත් කරන ලෙසට කර ඇති ඉල්ලීම සලකා මගේ අංක 02/02/ADM/විවිධ-10 හා 2021.05.04 දිනැති ලිපිය මගින් පරිසර අමාත්‍යාංශය සඳහා සංවර්ධන නිලධාරි තනතුරු 391ක් ඇති කිරීම සඳහා මු.රෙ 71 යටතේ අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇත. • කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/CM/11 හා 2023.01.25 දිනැති ලිපියෙන් සංවර්ධන නිලධාරීන් 299 ක් සඳහා මෙම අමාත්‍යාංශයට අනුමැතිය ලබා දී ඇත. • රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශය විසින් මෙම අමාත්‍යාංශයට නවක සංවර්ධන නිලධාරීන් 597ක් අනුයුක්ත කර තිබුනද 299 ක් සඳහා අනුමැතිය ලබාදී තිබීම ගැටළු සහගත වී ඇති බැවින් රාජ්‍ය සේවයේ බදවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීමේ කමිටුව වෙත අතිරික්ත සංවර්ධන නිලධාරීන් සඳහා අනුමැතිය ලබා දෙන ලෙස හෝ නැතහොත් වෙනත් රාජකාරි ස්ථානයකට ස්ථානගත කිරීම පිළබඳව විරුද්ධත්වයක් නොමැති බව 2023.08.14 හා ADM/02/02/01 අංක දරන ලිපියෙන් දන්වා ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි	2021 වර්ෂයේ පැවැති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම ප්‍රායෝගික නොවූ බැවින් පුහුණු අවස්ථා ප්‍රමාණය අඩු මට්ටමක පැවතුනි. තවද අංක

	21/1596/304/134 හා 2021.08.30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එවකට පැවැති තත්ත්වයන් අනුව මෙම වැය විෂයයයේ ද වියදම සමාලෝචනය කර රුපියල් මිලියන 1.2 ක් ප්‍රතිපාදන ඉතිරි වන බවට භාණ්ඩාගාරයට දැනුම් දී තිබුණි. ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 මඟින් රාජ්‍ය වියදම් දැරීම සම්බන්ධයෙන් සිදුකරන ලද සීමා කිරීම් හේතුවෙන් සැලසුම් කළ කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් 2023 වර්ෂයේද ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	ආයතනයේ ගිණුම් පිළිබඳ මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ නොවන අතර විගණකාධිපති වාර්තාව මඟින් ලබා දී ඇත්තේ තත්ත්වාගණනය කළ මතයකි.
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණකාධිපති වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර ඇත. “සොබාදම් පියස” ගොඩනැගිල්ල සම්බන්ධයෙන් වන නිර්දේශයන් සඳහා වර්තමාන තත්ත්වය පහත පරිදි වේ. • ගොඩනැගිල්ල පිහිටි ඉඩම පවරා දෙන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් කිහිපවරක් ඉල්ලීම් කර ඇත. ඉඩම පවරා දුන් පසු එහි තක්සේරු අගය මූල්‍ය නොවන වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කිරීමට කටයුතු කරනු ලැබේ. • ගොඩනැගිල්ලේ අවසන් බිල්පත ගෙවා අවසන් කළ පසු රැඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ.

නීතිඥ බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති

ලේකම්